සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாணக் கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| දෙවන වාරය - අනාවරණ පරීක්ෂණය | 2021 | 11 ශ්‍රේණිය |
| **தவணைப் பரீட்சை** | 2021 | **தரம்** – 11 |
| **Second Term - Diagnostic Test** | 2021 | **Grade 11** |

පුරවැසි අධ්‍යාපනය **I**
சுகாதாரமும் உடற்கல்வியும் I
**Health & Physical Education I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
3 **Hours**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමිවේ.

නම - ....................................................  විභාග අංකය - ..................................................

සැළකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝර ගන්න.
- නිවැරදි පිළිතුර තෝරන්න.

1. ''මහජනයා සෘජුවම පාලනයට සම්බන්ධ වීම සෘජු ප්‍රජාතන්ත්‍රවාදය නම් වේ'' සෘජු ප්‍රජාතන්ත්‍රවාදය පැවති රටකට නිදසුනක් වනුයේ,

   (I) ඕලන්දය  (II) මහා බ්‍රිතාන්‍ය  (III) ග්‍රීසිය  (IV) චීනය

2. ''ප්‍රජාතන්ත්‍රවාදය දේශපාලන දර්ශනයකි'' යනුවෙන් නිර්වචනය කරන ලද්දේ,

   (I) ඇරිස්ටෝටල්  (II) ජේ.ආර්.ලවෙල්  (III) සීලර්  (IV) ඒබ්‍රහම් ලින්කන්

3. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් යටතේ රාජ්‍යයේ පාලනය සිදුවන්නේ,

   I. සම්ප්‍රදායික චාරිත්‍ර ධර්ම පද්ධතියකට අනුවය.
   II. පොදු පිළිගැනීම් මාලාවක් මත පිහිටා කටයුතු කිරීමක්ය.
   III. පාලන මූලධර්ම හා කොන්දේසි මාලාවකට යටත්ය.
   IV. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අනුවය.

4. ප්‍රජාතන්ත්‍රවාදයේ කුළුණු තුන ලෙස දැක්වෙනුයේ,

   I. ව්‍යවස්ථාධායකය, විධායකය, අධිකරණය
   II. නිදහස, සමානාත්මතාව, අයිතිවාසිකම්
   III. යුතුකම්, වගකීම් හා අයිතිවාසිකම්
   IV. සහෝදරත්වය, සාමය හා අයිතිවාසිකම්

5. තරගකාරී පක්ෂ ක්‍රමයක් පැවතීමෙන් ඉටුවන යහපත් ලක්ෂණයක් නොවනුයේ,

   I. ඒකමතය නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් වීම.
   II. අත්තනෝමතික පාලනයක් බිහිවීම
   III. ආණ්ඩු පක්ෂයේ අහිතකර ප්‍රතිපත්ති නිවැරදි කරගැනීමට හැකිවීම.
   IV. ජනසමාජයේ පවතින විවිධත්වය නිරූපණය වීමට අවස්ථාව සැලසීම.

6. ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතුවක් නොවන කරුණු ඇතුළත් ප්‍රකාශය වන්නේ,

I. පුනරුදයයි
II. විද්‍යාත්මක දැනුම වර්ධනයයි
III. රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණයයි
IV. පළමු ලෝක මහා සංග්‍රාමයයි

7. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණයකි.

I. මධ්‍යගත පාලනයක් නොමැතිවීම.
II. අභ්‍යන්තර හා බාහිර ස්වාධිපත්‍ය බලයක් නොමැතිවීම.
III. වෘත්තීය නිලතල පැලැන්තියක් මඟින් පාලන බලය මෙහෙයවීම.
IV. භූමිය, ජනගහනය යන අංශයන්ගෙන් සමන්විත වීම.

8. ඒකීය රාජ්‍යයක් ලෙස සැලකෙන රට කුමක්ද?

I. ඇමෙරිකා එක්සත් ජනපදය
II. ඉන්දියාව
III. ස්විට්සර්ලන්තය
IV. මහා බ්‍රිතාන්‍ය

9. මධ්‍යම ආණ්ඩුවේ බලතල හා කාර්යයන් සම්බන්ධව සලකා බැලීමේදී විධායකය සතු කාර්යයක් නොවන්නේ,

I. නීති පැනවීම.
II. රාජ්‍ය සේවය පාලනය.
III. රාජ්‍ය ආරක්ෂක කාර්යයන් ඉටුකිරීම.
IV. රාජ්‍ය මූල්‍ය පාලනය.

10. ව්‍යවස්ථාදායකය සතු ප්‍රධාන කාර්යය භාරය,

I. නීති සම්පාදනය කිරීමයි.
II. ප්‍රතිපත්ති හා නීති ක්‍රියාත්මක කිරීමයි.
III. යුක්තිය පසඳලිමයි.
IV. රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධව කටයුතු කිරීමට .

11. ශ්‍රී ලංකාවේ පළාත් සභාවක ආයතනික ව්‍යුහය ගොඩනැගී ඇති ආකාරය අනුව ආණ්ඩුකාරවරයා සතු කාර්යය භාරයකි.

I. පළාත් සභාව කැඳවීම, වාර අවසාන කිරීම හා විසිරුවා හැරීම.
II. සිය කාර්යයන් සම්බින්ධයෙන් පළාත් සභාවට සාමූහිකව වගකීම.
III. පලාතේ ආර්ථික සංවර්ධන හා පරිපාලන සැලසම් සකස් කිරීම මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීම.

12. මධ්‍යම රාජ්‍යයන් පලාත් සභාවන් අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලබනනේ,

(I) මහඇමතිවරයාය (II) ආණ්ඩුකාරවරයාය (III) නීතිපතිතුමාය (IV) සභානායකවරයාය

13. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ජනාධිපතිවරයාගේ නිල කාලය වසර,

(I) 07කි. (II) 06කි. (III) 05කි. (IV) 04කි.

14. ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික සහයෝගීතාව ප්‍රකාශ වන ජාතික උත්සවය වන්නේ,

I. සිංහල හා හින්දු අලුත් අවුරුද්ද
II. නත්තල් උත්සවය
III. රාමසාන් උත්සවය
IV. නිදහස් සමරු උත්සවය

15. මිශ්‍ර ආර්ථික ක්‍රමයක ලක්ෂණයක් වන්නේ,

I. නිෂ්පාදන සාධකවල අයිතිය රජය සතුව පමණක් පැවතීම.
II. මධ්‍යගත සැලසුම් මණ්ඩලයකින් ආර්ථිකය මෙහෙය වීම.
III. ලාභය මුල්කරගෙන නිෂ්පාදන කටයුතු සිදු කිරීම.
IV. පෞද්ගලික හා රාජ්‍ය ව්‍යවසාය යන දෙඅංශයම පැවතීම.

16. වෙළඳපල ආර්ථික සංකල්පය තුළ හඳුනාගත හැකි අහිතකර ලක්ෂණයක් ඇතුළත් පිළිතුර තෝරන්න.

I. නිෂ්පාදන කටයුතු සිදු කිරීමේ දී වෙනස් පාර්ශවයන්ට තරගයක් දීම.

II. තරඟකාරී වෙළඳපලක් පැවතීම.

III. දේශීය හා විදේශීය ආයෝජකයන් දිරිගැන්වීම.

IV. පෞද්ගලික දේපළ අත්පත් කර ගැනීමේ නිදහස.

17. සමාජවාදී ආර්ථික ක්‍රමය පවතින රටවල නිෂ්පාදන සාධකවල අයිතියි පවතනුයේ,

I. රාජ්‍ය අංශය සතුවය.

II. පෞද්ගලික අංශය සතුවය.

III. පොදු සමාගම් සතුවය.

IV. රාජ්‍ය හා පෞද්ගලික අංශය සතුවය.

18. ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ,

I. ජෝහාස්වාස් විසිනි.

II. ජොහාස් ගැල්ටුගේ විසිනි.

III. සිග්මන් ෆොයිඩ් විසිනි.

IV. කාල් යුස්ක් විසිනි.

19. ගැටුම් නිරාකරණය සඳහා යොදා ගනු ලබන සම්ප්‍රදායික ක්‍රමයක් මෙන්ම පරාජයට පත්වන පාර්ශවයට ඉහළ අධිකරණයට අභියාචනය කිරීමේ හැකියාවකින් ද යුත් ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමවේදය වනුයේ,

I. විමසීම

II. උපදේශණය.

III. එකඟත්වය

IV. සමතකරණය

20. වර්තමානයේ සමාජය තුළ සිදුවන බොහෝ ගැටුම් හා ආරවුල් ආදියට මුල් වී ඇති ප්‍රධාන හේතුවක් වන්නේ,

I. පුද්ගලයන් තුළ නීතිය පිළිබඳ කිසි අවබෝධයක් නොතිබීම.

II. සමාජය සරළ තත්වයෙන් මිදී සංකීර්ණත්වයට පත් වීම.

III. සමාජයේ වෙසෙන පුද්ගලයින් පහළ අධ්‍යාපනයකින් යුතු වීම.

IV. නීතිය නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීම.

21. රටක උත්තරීතර මෙන්ම මූලික නීතයි ලෙසට ගැනෙනුයේ,

I. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.

II. මූලික අයිතිවාසිකම් ප්‍රකාශණයයි.

III. දණ්ඩනීති සංග්‍රහයයි.

IV. අපරාධ නීති විධිවිධාන පනතයි.

22. නීතියේ මූලික අරමුණු විස්තර වන ප්‍රකාශය ඇතුළත් පිළිතුර කුමක්ද?

I. රටේ සියලු පුරවැසියන්ට සාමය ලබා දීම.

II. රටේ සියලු පුරවැසියන්ට යුක්තිය ඉටු කිරීම.

III. රටේ සියලු වැරදිකරුවන්ට දඩුවම් ලබා දීම.

IV. නීතියේ ආධිපත්‍ය සුරැකීම හා රටේ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම.

23. ''කෙනෙකුට සැරයැටියක් වනමින් පාරේ ගමන් කළ හැකි වුවත් එම නිදහස අනෙකාගේ නාසය ළඟින් කෙළවර විය යුතුය.'' මෙම ප්‍රකාශය කරන ලද්දේ,

I. අයිවර් ජෙනින්ග්ස්ය.

II. හැරල්ඩ් ලෑස්කිය.

III. ඒබ්‍රහම් ලින්කන්ය.

IV. වින්ස්ටන් චර්චිල්ය.

24. ශ්‍රී ලංකාවේ ඉහළ උසාවි මගින් දෙන ලද තීන්දු පිළිබඳ අභියාචනා කිරීමේ බලය ද සහිත රාජාධිකරණය නම් වූ අධිකරණ රටාව පැවති පාලන සමය කුමක්ද?

I. පෘතුග්‍රීසි පාලන සමය.

II. ලන්දේසි පාලන සමය.

III. ඉංග්‍රීසි පාලන සමය.

IV. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක පාලන සමය.

25. පහත දැක්වෙන දෑ අතුරෙහි නීති මූලාශ්‍රයක් නොවන්නේ,

I. සිරිත් විරිත්.
II. ආගම.
III. අධිකරණ තීරණ.
IV. අයිතිවාසිකම්.

26. අභියාචනා කිරීමේ අවසරය ඇති ආයතනය වනුයේ,

I. මහාධිකරණය
II. මහේස්ත්‍රාත් අධිකරණය
III. පළාත්බද අධිකරණය
IV. ශ්‍රේෂ්ඨාධිකරණය

27. ජනාධිපති ආණ්ඩුක්‍රමයේ විශේෂ ලක්ෂණයක් වනුයේ,

I. ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරීම.
II. රාජ්‍ය නායකයා මෙන්ම ආණ්ඩුක්‍රම නායකයා අගමැතිවරයා වීම.
III. විධායක බලය හසුරුවනු ලබන්නේ ජනාධිපතිවරයා වීම.
IV. විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව ලැබේ.

28. පාර්ලිමේන්තු පනත් කෙටුම්පත නීතියක් බවට පත් වනුයේ,

I. ජනාධිපතිවරයාගේ අනුමැතිය ලැබීමෙනි.
II. කථානායකවරයා අත්මන් තැබීමෙනි.
III. අගමැතිවරයා අනුමත කිරීමෙනි.
IV. අමාත්‍යවරු අනුමත කිරීමෙනි.

29. සමාජීය ආණ්ඩුක්‍රමයක් පවතින රටකට නිදසුනක් වන්නේ,

I. ඕස්ට්‍රේලියාවයි
II. බ්‍රිතාන්‍යයි
III. ශ්‍රී ලංකාවයි
IV. මාලදිවයිනයි

30. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුධයට විසඳුමක් ලෙස හඳුන්වාදුන් පාලන ක්‍රමයක් වන්නේ,

I. මහ නගර සභාවයි
II. නගර සභාවයි
III. ගම් කාර්‍ය සභාවයි
IV. පළාත් සභාවයි

31. ශ්‍රී ලංකාවේ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා යන නිල නාමයෙන් හඳුන්වනු ලබන්නේ,

I. මහ ලේකම්වරයා
II. ඔම්බුඩ්ස්මන්
III. කතානායකවරයා
IV. වේත්‍රධාරීවරයා

32. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පළාත්සභාවක සිටින ඇමතිවරු ගණන,

I. මහාමාත්‍යවරයා ඇතුළුව 04 කි.
II. මහාමාත්‍යවරයා ඇතුළුව 05 කි.
III. මහාමාත්‍යවරයා ඇතුළුව 06 කි.
IV. මහාමාත්‍යවරයා ඇතුළුව 07 කි.

33. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණයක් වනුයේ මින් කුමක්ද?

I. ව්‍යවස්ථාදායකය තුළින් විධායකය උපත ලැබීම.
II. තනි විධායකයක් පැවතීම.
III. දේශපාලන පක්ෂ ක්‍රමයක් පැවතීම.
IV. ස්ථාවර ආණ්ඩුක්‍රමයක් පැවතීම.

34. රජයේ පරිපාලන ක්‍රියාවකින් සිදු වූ මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් පළමුවන පැමිණිල්ල කළ යුත්තේ,

I. ඔම්බුඩ්ස්මන්වරයා
II. කතානායකවරයා වෙතය.
III. මහාධිකරණය වෙතය.
IV. අධිකරණ සේවා කොමිසම වෙතය.

35. ළමා අයිවාසකිම් පිළිබඳව ප්‍රකාශය එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් සම්මත කරවා ගැනීමට මුල් වූ එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ආයතනය වනුයේ,

I. යුනිසෙෆ් සංවිධානය.
II. ලෝක සෞඛ්‍ය සංවිධානය.
III. යුනෙස්කෝ සංවිධානය.
IV. ලෝක කෘෂිකර්මය හා ආහාර සංවිධානය.

36. සමස්ථ ජාත්‍යන්තර ක්ෂේත්‍රය තුළම ආධිපත්‍ය පතුරුවාලීමට සමත් වන අයුරින් ගොඩනගා ඇති සංවිධානයක් වනුයේ,

I. එක්සත්ජාතීන්ගේ සංවිධානය.
II. ෆෙටෝ සංවිධානය.
III. සාර්ක් සංවිධානය.
IV. නොබැඳි ජාතීන්ගේ සංවිධානය.

37. ''එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර අධිකරණය මානව අයිතිවාසිකම් සුරැකීමට කටයුතු කරන උත්තරීතර ආයතනයකි.'' එය රැස් වන්නේ,

I. නෙදර්ලන්තයේ හේග් නුවරයි.
II. ඇමරිකාවේ නිව්යෝර්ක් නුවරයි.
III. ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවරයි.
IV. බ්‍රිතාන්‍යයේ ලන්ඩන් නුවරයි.

38. ගෝලීයකරණය ශ්‍රී ලංකාව කෙරෙහි සිදු කර ඇති ධනාත්මක හා ඍණාත්මක බලපෑම් පොදුවේ විස්තර කෙරෙන වරණය ඇතුළත් පිළිතුර තෝරන්න.

I. කාර්මික හා සේවා අංශවල ප්‍රගතියක් ඇති වීම හා ගෙවුම් ශේෂ තත්වය යහපත් වීම.
II. දේශීය නිෂ්පාදන පහළ වැටීම් හා දේශීය ළදරු කර්මාන්ත විනාශ වීම.
III. කාර්මික ආයතනවලින් සිදුවන පාරසරික හානි ඉහළ යාම හා විදේශ ණය ආධාර මත යැපීමට සිදු වීම.
IV. නිෂ්පාදන සඳහා අවශ්‍ය සියලුම යටිතල පහසුකම් දියුණු වීම හා දේශීය සම්පත් සූරා කෑමට ලක් වීම.

39. ලෝකයම එකම භාෂාවක් කතා කරන එකම මුදල් ඒකකයක් භාවිතා කරන තනි ජාතියක් බවට පත්විය යුතුය යන අදහස ඉදිරිපත් කළේ,

I. යුරෝපා සංගමයයි.
II. අන්තර්ජාතික මූල්‍ය අරමුදලයි.
III. එක්සත් ජාතීන්ගේ සංවිධානයයි.
IV. ආසියානු සංවර්ධන බැංකුවයි.

40. මිනිසාගේ ක්‍රියාකරකම් නිසා ඇතිවන පාරිසරික ගැටලු ඇතුළත් වරණය වනුයේ,

I. සුළි කුණාටු, සුනාමි, අම්ල වැසි
II. ලැව් ගිනි, අම්ල වැසි, ඕසෝන් ස්ථරයට වන හානි
III. අම්ල වැසි, දේශගුණ විපර්යාස, ඕසෝන් වියන තුනී වීම. නිෂ්පාදන සඳහා අවශ්‍ය සියලුම යටිතල
IV. නියගය, නාය යෑම්, අම්ල වැසි

## පුරවැසි අධ්‍යාපනය II

කාලය : පැය දෙකයි.

සැලකිය යුතුයි.

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. (i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන සමයේ ස්වරූප 02 ක් නම් කරන්න.

(ii) රාජ්‍යය හා ආණ්ඩුව අතර වෙනස්කම් 02 ක් ලියන්න.

(iii) වර්තමානයේ දී බහුල වශයෙන් අනුගමනය කරනු ලබන නියෝජන ක්‍රම 02 කුමක්ද?

(iv) ඒකීය රාජ්‍යක දක්නට ලැබෙන ලක්ෂණ 02 ක් ලියන්න.

(v) ආණ්ඩුක්‍රමවල ස්වරූප දෙක නම් කරන්න.

(vi) බලය විමධ්‍යගත කිරීමේ ප්‍රයෝජන 02 ක් ලියන්න.

(vii) පළාත් සභාවක ආණ්ඩුකාරවරයා සතු කාර්යයන් 02 ක් දක්වන්න.

(viii) සමාජයක් මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න 02 ක් ලියන්න.

(ix) අධිකරණයෙන් ඉටුවන කාර්යයන් 02 ක් ලියන්න.

(x) අයිතිවාසිකම් ක්‍රියාවලියට අයත්වන කරුණු 02 ක් ලියන්න. (ලකුණු 02 ×10=20)

02. ''ප්‍රජාතන්ත්‍රවාදයේ උපත ජනතා සහභාගීත්වයෙන් සිදු වන්නකි.''

(i) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඒබ්‍රහම් ලින්කන් ඉදිරිපත් කළ නිර්වචනය කුමක්ද?

(ලකුණු 02)

(ii) ජනමාධ්‍ය නිදහස තහවුරු කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග 03 ක් සඳහන් කරන්න.

(ලකුණු 03)

(iii) අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සළසා ඇති ප්‍රතිපාදන 03 ක් දක්වා ඉන් එක් කරුණක් විස්තර කරන්න.

(ලකුණු 05)

03. ''ශ්‍රී ලංකාව පළාත් පාලන ආයතන ව්‍යුහය තුළින් බලය විමධ්‍යගත කිරීමට කටයුතු යොදා ඇති අතර එය බොහෝ දුරට සාර්ථක වී ඇත''

(i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන 02 ක් නම් කරන්න.

(ලකුණු 02)

(ii) සෑම පළාත් පාලන ආයතනයකටම පොදුවේ පැවරෙන බලතල හා කාර්යය කොටස් 03 කවරේද?

(ලකුණු 03)

(iii) යහපාලනයේ ගුණාංග 03 දක්වා ඉන් එක් කරුණක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

04. (i) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් ලෙස සැළකීමට හේතු 02 ක් ලියන්න.

(ලකුණු 02)

(ii) බහු සංස්කෘතික සමාජයක් බිහිවීම කෙරෙහි බලපාන සාධක 03 ක් දක්වන්න.

(ලකුණු 03)

(iii) ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම 03 ක් දක්වා ඉන් එක් ක්‍රමයක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

05. ''මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මත විවිධ ආර්ථික ක්‍රම හඳුනා ගත හැකිය''

(i) ඕනෑම රටකට මුහුණ දීමට සිදුවන මූලික ආර්ථික ප්‍රශ්න 02 ක් සඳහන් කරන්න.

(ලකුණු 02)

(ii) ධනවාදී ආර්ථික ක්‍රමයක මූලික ලක්ෂණ 03 ක් සඳහන් කරන්න.

(ලකුණු 03)

(iii) A - යහපාලනයේ ගුණාංග 03 දක්වා ඉන් එක් කරුණක් පැහැදිලි කරන්න.

B - වෙළඳපොළ අර්ථ ක්‍රමයක් ඇතිවීම කෙරෙහි මුල්වන හේතු 03 ක් සඳහන් කරන්න.

(ලකුණු 05)

06. '' මිනිසුන්ගේ බාහිර පැවැත්ම පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් පනවන රෙගුලාසි නති නම් වේ.''

(i) නීතිය තුළ අත්‍යාවශ්‍යයෙන්ම තිබිය යුතු ගුණාංග 02 ක් ලියන්න.

(ii) දේශීය නීතියේ ප්‍රභේද 03 ක් නම් කරන්න.

(iii) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති පියවර 03 ක් දක්වා ඉන් එකක් විස්තර කරන්න.

07. ''මිනිසුන් ලෙස උපත ලබන සෑම කෙනෙකුටම කිසිදු භේදයකින් තොරව මානව අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතියක් ඇත.''

(i) මානව අයිතිවාසිකම් යනු කුමක්ද?

(ලකුණු 02)

(ii) අයිතිය හා නීතිමය පදනම මත අයිතිවාසිකම් වර්ග කළ හැකිය. ඉන් 03 ක් නම් කරන්න.

(ලකුණු 03)

(iii) පුරවැසියෙකුට භුක්ති විඳිය හැකි අයිතිවාසිකම් 03 ක් දක්වා ඉන් එකක් පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 05)

# පිළිතුරු පත්‍රය

## පුරවැසි අධ්‍යාපනය I

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|
| 1 | iii |
| 2 | ii |
| 3 | ii |
| 4 | ii |
| 5 | ii |
| 6 | iv |
| 7 | iv |
| 8 | iv |
| 9 | iv |
| 10 | i |
| 11 | i |
| 12 | ii |
| 13 | iii |
| 14 | iv |
| 15 | iv |
| 16 | iv |
| 17 | i |
| 18 | ii |
| 19 | i |
| 20 | ii |
| 21 | i |
| 22 | ii |
| 23 | ii |
| 24 | iii |
| 25 | iv |
| 26 | iv |
| 27 | iii |
| 28 | ii |
| 29 | i |
| 30 | iv |
| 31 | ii |
| 32 | i |
| 33 | i |
| 34 | i |
| 35 | i |
| 36 | i |
| 37 | i |
| 38 | ii |
| 39 | iv |
| 40 | ii |